# ජාතික සංවර්ධනය සඳහා අනගාරික ධර්මපාලතුමාගේ යුග මෙහෙවර පිළිබඳ විමසුමක්

**ඩබ්.ඒ.ඩී. තමාරා කුමාරි[1]**

*[1]සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.*

*[1*]thamarakumari87@gmail.com*

යටත් විජිතවාදයෙන් රට, ජාතිය, ආගම, සංස්කෘතිය හා සභ්‍යත්වය දෙදරුම් කා ගිය යුගයක නිදහස්, නිවහල් ජාතියක් ගොඩ නඟනු වස් තම මුළු දිවිය ම කැප කළ විමුක්තිදායකයාණන් වූයේ අනගාරික ධර්මපාලතුමා ය. දේශය තුළ බලහත්කාරයෙන් වපුරා තිබූ පරගැති චින්තනය බිඳ හෙළමින්, නිදා සිටි ජාතියක් යළි අවදි කරවීමේ යුග මෙහෙවරක එතුමා නිරත විය. දොන් ඩේවිඩ් හේවාවිතාරණ නමින් ඉපිද, ධර්මපාල නමින් පසු ව නම වෙනස් කොට, අනගාරික ජීවිතයක් ගත කළ ඔහු සිරි දේවමිත්ත නමින් පැවිදි ව සංස්කෘතික, ආර්ථික දෙආකාරයෙන් ම පිරිහී තිබූ දේශයක් පුනර්ජීවනය කිරීමට කටයුතු කළේය. කොළඹ ධනවත් ප්‍රභූ පවුලක ඉපදී, බටහිර සංස්කෘතියේ දියුණු හරය අගයමින් ඒ අනුව ජාතික සංවර්ධනයට ගුරු හරුකම් ලබා දුන් එතුමා, දේශීය අනන්‍යතාව විනාශ කරවන බටහිර සභ්‍යත්වයේ අහිතකර තත්ත්වය වෙනස් කිරීම වෙනුවෙන් තම විමුක්ති සටන ඇරඹීය. පැවිදි නොවී අනගාරිකව කාලීන අවශ්‍යතාවක් වූ සමාජය යහපත් කිරීමේ අරමුණින් ජාතික සංවර්ධනය ඔස්සේ සිදු කළ සේවාව හා ඉන් ජනිත වූ පුනර්ජීවනය විමසීම මෙහි ප්‍රධාන අරමුණ ලෙස පෙන්වා දිය හැකි ය. ජාතික සංවර්ධනය උදෙසා එතුමා සිදු කළ සේවාව කොතෙක් දුරට සාර්ථක වීද යන්න මෙහි පර්යේෂණ ගැටලුව විය. මෙම පර්යේෂණය පුස්තකාල සමීක්ෂණ ක්‍රමවේදය හා අනගාරික ධර්මපාලතුමා පිළිබඳ මූලාශ්‍රගත තොරතුරු අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය (Content Analizese) ඔස්සේ ගැඹුරින් අධ්‍යයනයට ලක් කළේ ය. ඒ ඔස්සේ ලබා ගත් තොරතුරු මඟින් අනාවරණය වූයේ දියුණු සමෘද්ධිමත්, තාක්ෂණයෙන් උසස් අධ්‍යාපනික ස්වයං විනයක් සහිත සමාජයක් ගොඩනැංවීමට එතුමාගේ සිය ජීවිතය කැප කළ බව ය. ස්ව භාෂාව ප්‍රගුණ කොට ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීමේ වැදගත්කම පසක් කර දුන් එතුමා ආනයනයට විරුද්ධ ව දේශීය කර්මාන්ත ගොඩ නැඟීමට ජනතාව යොමු කරවිය. පුවත්පත් ඔස්සේ සංස්කෘතිකමය සන්නිවේදනයක් ලබා දුන් එතුමා රෝහල් ආදි යටිතල පහසුකම් ඉදි කිරීමත්, පාඨශාලාවල ශාස්ත්‍ර කර්මාන්ත ඉගැන්වීමත් සිදු කළ යුතු බව පෙන්වා දෙමින් ජාතික සංවර්ධනය උදෙසා සුවිශාල මෙහෙවරක් ඉටු කළේ ය.

මුඛ්‍ය පද ඃ අනගාරික ධර්මපාලතුමා, ජාතින සංවර්ධනය, යටත් විජිතවාදය, විමුක්තිය,
පුනර්ජීවය.